සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
மூன்றாந் தவணை
Third Term Evaluation
2019

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: 1 | පැය / மணித்தியாலம் / Hours: 01 |

සැලකිය යුතුයි.

( i ) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.

( ii ) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වලදී ඇති (1),(2),(3),(4)පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට . සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.

---

(01) සන්නිවේදකයා ඉදිරිපත් කළ යුතු අදහස අන්තර්ගත වන්නේ,

(1) මාධ්‍යයයි (2) සංදේශයයි (3) බලපෑමයි (4) ග්‍රාහකයායි

(02) මානවයා දෛනික කටයුතු සැලසුම් කිරීමේදී බහුලව භාවිත වන අවාචික සන්නිවේදන විධි ක්‍රමය වන්නේ,

(1) කාය භාෂාව (2) ලිඛිත භාෂාව (3) වාචික භාෂාව (4) මාධ්‍ය භාෂාව

(03) සන්නිවේදන ස්වරූප පමණක් අඩංගු වන්නේ,

(1) පුද්ගලාන්තර/සමූහ/ජන සන්නිවේදනය (2) පුද්ගලාන්තර/ශ්‍රව්‍ය/දෘශ්‍ය

(3) සමූහ/අන්තර්වර්ති/වාචික (4) වාචික/අවාචික/ලිඛිත

(04) සන්නිවේදනය පිළිබඳ ගණිතමය සූත්‍රයක් ඉදිරිපත් කළ සන්නිවේදකයින් වන්නේ,

(1) ක්ලෝඩ් ෂැනෝන් හා වොරන් වීවර් (2) ක්ලෝඩ් ෂැනෝන් හා හැරල්ඩ් ඩී.ලැස්වෙල්

(3) වොරන් වීවර් හා හැරල්ඩ් ඩී.ලැස්වෙල් (4) වොරන් වීවර් හා විල්බර් ශ්‍රාම්ය

(05) ග්‍රාහකයාගේ සංජානනයට බාධා පැමිණෙන හේතුවක් වන්නේ කුමක් ද?

(1) සංදේශය තුළ විවිධාර්ථ නොතිබීම. (2) නිවැරදි ලෙස තොරතුරු ගොනු කර සංදේශය සැකසීම.

(3) සංදේශයේ තොරතුරු විකෘති වී තිබීම. (4) ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට ගැළපීම.

(06) ජන සන්නිවේදනයේදී සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳ සාවද්‍ය . . ප්‍රකාශය වන්නේ මින් කවරක්ද?

(1) සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර දුරස්ථ සම්බන්ධතාවක් පවතී.

(2) සන්නිවේදකයා ග්‍රාහකයා කවුරුන් දැයි නිශ්චිතව නොදනී.

(3) සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර ප්‍රතිචාර,ප්‍රතිපෝෂණ හොඳින් ක්ෂණිකව සිදුවේ.

(4) සන්නිවේදකයා හා ග්‍රාහකයා මුහුණට මුහුණ හමු නොවේ.

(07) වාචික භාෂාවට වඩා ලිඛිත භාෂාවක් විධිමත් වීම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) ව්‍යාකරණයක් තිබීමයි. (2) විරාම ලක්ෂණ නිවැරදිව යෙදීමයි.

(3) ඡේද වෙන් කර ලියා තිබීමයි. (4) එක් වාක්‍යයක් තවත් වාක්‍යයකින් වෙන් නොකිරීමයි.

(08) දොරටුපාල සංකල්පයේ අරමුණ වන්නේ,

(1) මාධ්‍ය හිමිකාරත්වයේ අදහස් පාලනය කිරීම.

(2) ග්‍රාහකයාගේ අදහස් පාලනය කිරීම.

(3) තොරතුරු කිසියම් පාලනයකට යටත්ව ඉදිරිපත් කිරීමයි.

(4) ග්‍රාහකයාට තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය ඇහිරීමයි.

(09) “නිපුනිකා තම සොයුරියට දුරකථන ඇමතුමක් ගැනීමට සිතුවාය.අනතුරුව ඇය තම මවගෙන් මේ පිළිබඳ විමසුවාය.”
ඉහත සඳහන් වූ සංවාදය ඇතුළත් වන සන්නිවේදන වර්ගයන් පිළිවෙලින්,

(1) අන්තර් පුද්ගල හා අන්තර් වර්ති පුද්ගල සන්නිවේදනය

(2) අන්තර් පුද්ගල හා සමූහ සන්නිවේදනය

(3) අන්තර් වර්ති පුද්ගල හා අන්තර් පුද්ගල සන්නිවේදනය

(4) සමූහ හා අන්තර් වර්ති පුද්ගල සන්නිවේදන

(10) සන්නිවේදකයා ප්‍රදීපාගාර උපක්‍රමය භාවිතා කරන්නේ කුමන සන්නිවේදන වර්ගයේදීද?

(1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය (2) අන්තර් පුද්ගල සන්නිවේදනය

(3) සමූහ සන්නිවේදනය (4) ජන සන්නිවේදනය

(11) යම් අයදුම් පතක් කාර්යාලයට ලැබෙන්නේ ලැබිය යුතු දිනය පසුවීමෙනි.එබැවින් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කාර්යාලයට තිබේ.මෙය තීරණය වන්නේ,

(1) දින මුද්‍රාව පරික්ෂා කිරීමෙනි. (2) නිල මුද්‍රාව පරික්ෂා කිරීමෙනි.

(3) අයදුම්කරුගේ අත්සන පරික්ෂා කිරීමෙනි. (4) ඉහත කරුණු කිසිවක් නිසා නොවේ.

(12) ශ්‍රී ලංකාවේ රාජ්‍ය අනුග්‍රහය යටතේ ප්‍රකාශිත පළමුවන පුවත්පත වන්නේ,

(1) සිංහල බෞද්ධයා (2) ඥානාර්ථ ප්‍රදීපය

(3) කලම්බු ජර්නල් (4) ලංකාලෝකය

(13) සන්නිවේදනයේ මූලික කාර්යයක් ලෙස නොගන්නේ මින් කුමක් ද?

(1) සංවාද හා සාකච්ඡා (2) සංස්කෘතික ප්‍රගමනය

(3) ඒකාබද්ධතාව (4) සාක්ෂරතාව

(14) අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා යොදා ගන්නා තාක්ෂණික මෙවලම් අයත් නිවැරදි වරණය වන්නේ මින් කුමක් ද?

a - විද්‍යුත් තැපැල
b-රූපවාහිනිය
c-ජංගම දුරකථනය
d-ෆැක්ස් පණිවුඩ

(1) a , b , c (2) a , b , d (3) b , c , d (4) a , c , d

(15) පුවත්පතක කාටූන් අයත් වන්නේ,

(1) විශේෂාංග අංශයට (2) ජයාරූප අංශයට

(3) චිත්‍ර නිර්මාණ හා රූ රටා සැලසුම් අංශයට (4) දැන්වීම් අංශයට

(16) ශ්‍රී ලාංකිකයින් දෙදෙනෙකු විසින් රාවනා I චන්ද්‍රිකාව ගුවන්ගත විම පිළිබඳව ජනමාධ්‍ය විසින් වාර්තා කරන ලදී.මෙය අයත් ජන මාධ්‍ය නියෝජන අධ්‍යයනය නම්,

(1) වැඩ ලෝකයට (2) වෙළඳපොලට

(3) සංවර්ධනාත්මක චින්තනයට (4) විවිධ වෘත්තීන්ට

(17) “සිංහල,දෙමළ හා මුස්ලිම් ජනයා බොහෝ විට වෙන් වෙන්ව හඳුනා ගත හැකි ආකාරයෙන් ඇඳුම් පැළඳුම් අඳිති”මෙයින් පිළිබිඹු වන්නේ,

(1) ස්ත්‍රී පුරුෂ සමාජ භාවයයි (2) සමාජ ප්‍රතිරූපයයි.

(3) වාර්ගිකත්වයයි (4) පුරවැසිභාවයයි

(18) ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගොඩනැගී ඇති සංකල්ප පහත දැක්වේ.

A - ජීව විද්‍යාත්මක සංකල්පයකි.
B - සමාජ විද්‍යාත්මක සංකල්පයකි.
C - දියුණු සමාජයකට උචිත සංකල්පයකි.
D - මනෝ විද්‍යාත්මක සංකල්පයකි.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

(1) A,B,C (2) B,C,D (3) A,C,D (4) A,B,D

(19) නිශ්චල ජයාරූපයක් ගැනීමේදී පාර්ශව හතරක් සම්බන්ධ වේ.එයට අයත් නොවන්නේ,

(1) ජායාරූප ශිල්පියාය. (2) වේශ නිරූපණ ශිල්පියාය.

(3) කැමරාව සහ දර්ශනය. (4) ආලෝකය

(20) සිනමා රූපගත කිරීම්වලදී සෑම රූප රාමුවක්ම ජායාරූපගත කිරීමේ වැදගත්කම වන්නේ,

(1) අඛණ්ඩතාවය ආරක්ෂා කර ගැනීමය. (2) නළු නිළියන් තෝරා ගැනීමටය.

(3) පූර්ව ප්‍රචාරක කටයුතු සඳහාය. (4) සිනමාව උසස් තත්වයකට ගෙන ඒම සඳහාය.

(21) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ විශේෂතාවක් නොවන්නේ මින් කුමක් ද?

(1) ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය ලැබීම. (2) තම දැක්ම අනුව සංකල්ප ක්‍රියාත්මක වීම.

(3) සිතිවිලි හා හැඟීම් මත සන්නිවේදනය සිදුවීම. (4) සංවිධිත ආයතනයක් මඟින් ක්‍රියාත්මක වේ.

(22) භාෂාවේ මූලික කාර්යයන් අයත් වන නිවරැදි වරණය තෝරන්න.

a - සිතීම විධිමත් කිරීම
b - වාචික ප්‍රකාශනය
c - සැබෑව හඳුනා ගැනීම
d - කාලය සන්නිවේදනය විම

.

(1) a , b , c (2) a , b , d (3) b , c , d (4) a , b , c ,d

(23) A - අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව

B - පහසුවෙන් ග්‍රාහක ආකර්ශනය ලබා ගැනීමට නොහැකි වීම.

C - ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට නොහැකි වීම.

D -පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගත වීමට ඇති හැකියාව.

මින් නිශ්චල ජායාරූප භාවිතා වන නිසා මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A හා D ය.

(24) පුරවැසිභාවය යන්න පිළිබඳ නිවැරදි වරණය තෝරන්න.

(1) වැඩ ලෝකයේ ගැළපෙන වෘත්තියක් තෝරාගෙන ඒ අනුව ජීවත් වෙන තැනැත්තෙකි.

(2) තම මානව හිමිකම් පවත්වා ගනිමින් රටේ නීතිරීති වලට අනුව ජීවත් වන තැනැත්තෙකි.

(3) යම් නිත්‍යානුකූල දේශසීමාවක් තුළ නිත්‍යානුකූලව ජීවත් වන තැනැත්තෙකි.

(4) නිදහසේ ජීවත් වීමට යෝග්‍ය පරිසරයක් ගොඩ නගා ගත් තැනැත්තෙකි.

(25) මුදල් ගනුදෙනුව වඩාත් ඉක්මනින් හා නිවැරදිව සිදු කිරීමටත්, මුදල් භාර ගන්නා තැනැත්තාට මුදල් සඟවා ගැනීමට ඇති ඉඩකඩ අවහිර කිරීමත් කළ හැක්කේ,

(1) මුදල් ගණින යන්ත්‍රයෙනි (2) මුදල් සටහන් යන්ත්‍රයෙනි

(3) ගණක යන්ත්‍රයෙනි (4) පරිගණක යන්ත්‍රයෙනි

(26) විද්‍යුත් කැඳවනයේ (පේජරය) ලක්ෂණයක් වන්නේ පහත සඳහන් වැකි අතුරින් කුමක් ද?

(1) රහස් රහිතව තොරතුරු හුවමාරු කළ හැකි සන්නිවේදන උපකරණයකි.

(2) කථනය මඟින් තොරතුරු හුවමාරු කර ගත හැකිය.

(3) මෙහි විශාල තිරයක් දැකිය හැකිය වීම.

(4) එකවර එක් පණිවිඩයක් පමණක් යැවිය හැකි ය.

(27) පුවත්පතක දේශීය පුවත් හා විදේශීය පුවත් ලෙස කොටස් දෙකකි.එහි දේශීය හා විදේශීය ප්‍රවෘත්ති සංස්කාරක කර්තෘවරුන් අයත් වන්නේ කුමන අංශයටද?

(1) සංස්කරණ අංශයට (2) විශේෂාංග අංශයට

(3) ප්‍රවෘත්ති අංශයට (4) දැන්වීම් අංශයට

(28) ප්‍රවෘත්ති ඡායාරූපයක අඩංගු විය යුතු ප්‍රවෘත්තිමය ගුණාංගයක් නොවන්නේ,

(1) කාලෝචිත බව (2) කැපී පෙනීම (3) සාමාන්‍ය බව (4) සමීපතාව

(29) දැක්විය යුතු යමක් හෝ යොමු කළ යුතු යම් ලේඛනයක් ඒම පුද්ගලයාටම නිල වශයෙන් සාර්ථකව ලබා දිය හැක්කේ,

(1) පේජරය මඟින් (2) දුරකථනය මඟින් (3) විද්‍යුත් තැපැල මඟින් (4) ෆැක්ස් මඟින්

(30) A - මාධ්‍ය ආයතන වල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනුයේ ආයතනයේ මාධ්‍යවේදීන් විසිනි.

B - ග්‍රාහකයා වෙත ළඟා වන මාධ්‍ය සංදේශ තුළ මාධ්‍ය හිමිකරුවන්ගේ ප්‍රතිපත්ති නිරූපණය වේ.

C - ලංකාවේ රජයේ ගුවන්විදුලිය හා රජයේ රූපවාහිනී ආයතන මඟින් මහජනයාට බලපත්‍ර නිකුත් කර මුදල් උපයා ගනී.

D - ජනමාධ්‍ය හිමිකම තුළ රජයට හිමි මෙන්ම පෞද්ගලික හිමිකම ඇති ආයතනද දැක ගත හැක.

මින් ජනමාධ්‍ය ආයතන හිමිකම පිළිබඳ සත්‍ය වන්නේ,

(1) A , B , C පමණි. (2) A , B , D පමණි. (3) C , D , A පමණි. (4) A , B , C , D සියල්ලමය.

(31) වර්තමාන මාධ්‍ය නිර්මාණවල අන්තර්ගතයද,ආකෘතියද,ඉදිරිපත් කිරීමද,ගුණාත්මක වශයෙන් ද පහළ වැටී ඇත.එයට හේතුවක් වන්නේ,

(1) වෙළඳ අනුග්‍රාහකයන් අතර තරඟකාරීත්වය.  (2) නිර්මාණකරුවන් අතර තරඟකාරීත්වය

(3) මාධ්‍ය හිමිකරුවන් අතර පවතින තරඟකාරීත්වය  (4) ඉහත සියල්ලම

(32) කළු ලෑල්ල පරිහරණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ මින් කවරක් ද?

(1) ලෑල්ල සමස්ත පන්තියටම දර්ශනය විය යුතුය.

(2) ලෑල්ලේ දකුණේ සිට වමට ලිවිය යුතුය.

(3) ලෑල්ලේ යමක් දැක්වීමේදී පසුපස පේළියටද හොඳින් දර්ශනය වන පරිදි ලිවිය යුතුය.

(4) ගුරුභවතා පන්තියෙන් බැහැර වන විට තමන් විසින් කළුලෑල්ලේ ලියූ සියලු දේ මකා දැමිය යුතු වේ.

(33) * නිර්මාණශීලී වීම.

* නව තාක්ෂණය හා අත්වැල් බැඳ ගැනීම.

* ඡායාරූපකරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුම.

* ඉගෙනීමට කැමැත්තක් දැක්වීම.

ඉහත ලක්ෂණ තිබිය යුත්තේ,

(1) ප්‍රධාන කර්තෘ තුළය.  (2) ප්‍රවෘත්ති නිලධාරියා තුළය.

(3) මාධ්‍ය හිමිකාරිත්වය තුළය.  (4) ඡායාරූප ශිල්පීය වෘත්තිකයා තුළය

(34) ඩිජිටල් ඡායාරූපකරණයේ විශේෂතා පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

A - ලබාගත් ඡායාරූප ඒ අවස්ථාවේදීම නැරඹිය හැකි වීම.

B - විද්‍යුත් තැපැල අන්තර්ජාලය,ජංගම දුරකථනය වැනි සන්නිවේදන ජාලයට යොමු කළ නොහැකි වීම.

C - කාර්යක්ෂමව සංස්කරණය කිරීමට පහසු වීම.

D - සේයා පටල මිලදී ගැනීමට සිදු වීම.

(1) AB සත්‍ය වේ CD අසත්‍ය වේ.  (2) BC සත්‍ය වේ AD අසත්‍ය වේ.

(3) AC සත්‍ය වේ BD අසත්‍ය වේ.  (4) CD සත්‍ය වේ AB අසත්‍ය වේ

(35) ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකා සඳහා බලපත්‍ර ලබාදීම හා සේවාවන් අත්හිටුවීම සිදු කරන රාජ්‍ය ආයතනය වන්නේ,

(1) රාජ්‍ය සේවා කොමිෂන් සභාව  (2) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

(3) පුවත්පත් මණ්ඩලය  (4) රැගුම් පාලක මණ්ඩලය

(36) රජයක තිබිය යුතු ප්‍රධාන අරමුණක් නොවන්නේ මින් කුමක් ද?

(1) විවිධ සංවර්ධන සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

(2) රජයේ දේශපාලන ප්‍රතිපත්ති හා දර්ශනය මහජනයා තුළ තහවුරු කිරීම.

(3) රජය ස්ථාවරව පවත්වා ගෙන යාම.

(4) මහජන මතයට එරෙහිව සැම විටම ක්‍රියාත්මක විම.

(37) විද්‍යුත් තරංග ඔස්සේ ලිඛිත සටහනක් සන්නිවේදනය කළ හැකි වන්නේ,

(1) ඩිජිටල් අනුපිටපත් යන්ත්‍රය මඟින් (2) ෆැක්ස් යන්ත්‍රය මඟින්

(3) ඡායා පිටපත් යන්ත්‍රය මඟින් (4) තැපැල් මුද්‍රා යන්ත්‍රය මඟින්

(38) ඡායාරූපකරණය හා සම්බන්ධ වෘත්තීන් පිළිබඳ නිවරැදි වරණය තෝරන්න.


(1) රූපගත කිරීම් සහායක,ආලෝකකරණ ශිල්පී,ඡායාරූප මුද්‍රණ ශිල්පී,ප්‍රවෘත්ති කර්තෘ

(2) රූපගත කිරීම් සහායක,ආලෝකකරණ ශිල්පී, ඡායාරූප සංස්කරණ ශිල්පී, ඡායාරූප මුද්‍රණ ශිල්පී

(3) පුවත්පත් මුද්‍රණ ශිල්පී,ආලෝකකරණ ශිල්පී,ඡායාරූප නිමැවුම් ශිල්පී,ඡායාරූප සංස්කරණ ශිල්පී

(4) ඡායාරූප කර්තෘ,ප්‍රවෘත්ති සංස්කරණ ශිල්පී,ඡායාරූප මුද්‍රණ ශිල්පී,ආලෝකකරණ ශිල්පී

(39)




ඉහත දැක්වෙන්නේ සන්නිවේදනයේ,

(1) චක්‍රීය ආකෘතියකි. (2) දාම ආකෘතියකි.

(3) වයි ආකෘතියකි. (4) රෝද ආකෘතියකි.

(40) සමූහ සන්නිවේදනයට අයත් වන්නේ,

(1) දෙදෙනෙක් දූරකථන සංවාදයක යෙදීම. (2) ගමේ පැවැත්වෙන සමෘද්ධි රැස්වීමක්

(3) අගමැතිතුමා රූපවාහිනියෙන් ජාතිය ඇමතීම. (4) යමෙකු කාව්‍ය නිර්මාණයක් සිදු කිරීම.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ අවසාන ඇගයීම - 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

I පත්‍රය - 10 ශ්‍රේණිය

<u>පිළිතුරු පත්‍රය</u>

| | | | |
|---|---|---|---|
| (1) – 2 | (11) - 1 | (21) - 4 | (31) - 4 |
| (2) - 1 | (12) – 3 | (22) – 4 | (32) - 2 |
| (3) – 4 | (13) – 4 | (23) – 4 | (33) - 4 |
| (4) – 1 | (14) – 4 | (24) – 3 | (34) - 3 |
| (5) – 3 | (15) – 1 | (25) – 2 | (35) - 2 |
| (6) – 3 | (16) – 3 | (26) – 1 | (36) - 4 |
| (7) – 4 | (17) - 3 | (27) – 3 | (37) - 2 |
| (8) – 3 | (18) - 1 | (28) – 3 | (38) - 2 |
| (9) – 3 | (19) - 2 | (29) – 3 | (39) - 4 |
| (10) – 3 | (20) - 1 | (30) – 2 | (40) - 2 |

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
மூன்றாந் தவணை **2019**
Third Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

සැලකිය යුතුයි.

* පළමු වන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න .

* පළමු වන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමිවේ.

(01) ක්‍රි.ව.1832 දී ලංකාවේ ප්‍රථම පුවත්පත ප්‍රකාශයට පත්කළ අතර මුල්ම ගුවන්විදුලිය ආරම්භවන්නේ ක්‍රි.ව 1924 දීය .ඉන්පසුව 1979 දී ප්‍රථම රූපවාහිනී සේවාව ආරම්භ විය.

( i ) මෙම මාධ්‍ය ආයතන තුනම අයත්වන සන්නිවේදන වර්ගය නම් කරන්න.

( ii ) පුවත්පත්,ගුවන්විදුලිය,රූපවාහිනිය ,අද වන විට නව මාධ්‍ය මගින් නැරඹිය හැක.එය හැඳින්වෙන නම කුමක්ද?

(iii) පුවත්පත හා ගුවන්විදුලිය සමග සම්බන්ධ වන ග්‍රාහකයන් හඳුන්වන නම් ලියන්න.

(iv) රජයට කොටස් හිමි පුවත්පත් ආයතනය නම් කරන්න.

( v ) පුවත්පත් ආයතනයක් හා සම්බන්ධ මාධ්‍ය ශ්‍රමිකයින් දෙදෙනෙක් නම් කරන්න.

(vi) රූපවාහිනී වැඩසටහන් වල නිශ්චල ජායාරූප යොදා ගන්නා අවස්ථා දෙකකට උදාහරණ ලියන්න.


(vii) ගුවන්විදුලි ආයතනයක දැන්වීම් අංශයෙන් සිදුකරන කාර්යයන් දෙකක් ලියන්න..

(viii) ආයතනයක අවිධිමත් සන්නිවේදනය සිදුවන ආකාර දෙකක් ලියන්න.

(ix) එකම භාෂාවක ලිඛිත හා කථන යන ස්වරූප දෙකම තිබීම කුමන නමකින් හැඳින්වේද ?

( x ) පරිකල්පන ශක්තිය වැදගත් වන ජන මාධ්‍ය නම් කරන්න.

(02) පහත දැක්වෙනුයේ ඔබ ඉගෙනගත් සන්නිවේදන ආකෘතියකි.




( i ) මෙම සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින්ද?

( ii ) මෙහි B,C,D,E නම් කරන්න..

(iii) සන්නිවේදනයේ දී සිදුවන බාධක නම්කර කෙටි විස්තරයක් කරන්න.

(iv) සන්නිවේදනයේ ප්‍රධාන අරමුණු 04ක් කෙටියෙන් විස්තර කරන්න.

(03) පාසලේ ප්‍රධාන රැස්වීම අමතා කථාවක් කිරීමට සූදානම් වන ලෙස පන්තිභාර ගුරුතුමිය තමාලිට පැවසීය. තමාලි ඉතා උනන්දුවෙන් පොත පතින්,අන්තර්ජාලයෙන් තොරතුරු ලබාගෙන සාර්ථක කථාවක් ඉදිරිපත් කරන ලදී.

( i ) මෙම අවස්ථාවල තමාලිට සම්බන්ධ වන සන්නිවේදන වර්ග දෙකක් නම් කරන්න.

( ii ) කථාව සාර්ථකව ඉදිරිපත් කිරීමට තමාලිට භාවිතා කළහැකි උපක්‍රමය කෙටියෙන් විස්තර කරන්න.

( iii ) දක්ෂ කථිකාවියක් වීමට,තමාලි වර්ධනය කර ගතයුතු වාචික සන්නිවේදන නිපුණතා තුනක් කෙටියෙන් විස්තර කරන්න.

( iv ) අවාචික සන්නිවේදනයේ අංග 04ක් විස්තර කරන්න

(04) අද ජනතාව තුළ ජනප්‍රිය සන්නිවේදන උපකරණය වන්නේ ජංගම දුරකථනයයි.

( i ) පණිවිඩ හුවමාරුව හැර ජංගම දුරකථනයේ ප්‍රයෝජන දෙකක් ලියන්න.

( ii ) දුරකථනය හැර කාර්යාලයක තොරතුරු හුවමාරුව සඳහා යොදා ගන්නා මාධ්‍ය උපකරණ 02 ක් නම් කර, එකක් කෙටියෙන් හඳුන්වන්න.

( iii ) පන්ති කාමරයේ භාවිත කරන ප්‍රක්ෂේපණීය නොවන ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ 3 ක් නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න

( iv ) සංවෘත පරිපථ රූපවාහිනී කැමරාව (CCTV) සහ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය සන්නිවේදනය සඳහා යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.

(05) අන්තර්ජාලය හා බද්ධ වූ තොරතුරු බෙදා හැරීමේ ක්‍රියාවලිය ලෝකය පුරා පැතිර ඇත .

( i ) අන්තර්ජාලය හා සම්බන්ධ ජනප්‍රිය සමාජ මාධ්‍ය දෙකක් නම් කරන්න.

( ii ) විද්‍යුත් තැපැල භාවිතයේ වාසි දෙකක් ලියන්න.

( iii ) අන්තර්ජාල වෙබ් අඩවියකින් ආයතනයකට ඇති වාසි තුනක් කෙටියෙන් විස්තර කරන්න.

( iv ) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ (DTP) ප්‍රධාන පියවර කෙටියෙන් විස්තර කරන්න.

(06) වචනයෙන් විස්තර කළ නොහැකි බොහෝ දේ ඡායාරූපයකින් විස්තර කළ හැකිය.

( i ) ආධුනික ශිල්පියෙකුට භාවිතයට වඩා පහසු කැමරාව කුමක්ද?

( ii ) කැමරාවක අනිවාර්යයෙන්ම තිබිය යුතු අංග දෙකක් නම් කරන්න.

( iii ) ප්‍රවෘත්ති වාර්තාවක ඡායාරූප භාවිතයෙන් ග්‍රාහකයාට ලැබෙන ප්‍රයෝජන 3ක් කෙටියෙන් විස්තර කරන්න.

( iv ) පුවත්පත් හිමිකාරිත්වයේ මූලික ප්‍රභේද 4ක් විස්තර කරන්න.

(07) ජනමාධ්‍ය මඟින් ග්‍රාහක ගත කරන සංදේශ ග්‍රහණය කර ගැනීමට එම සංදේශවල නියෝජනයන් පිළිබඳ දැනුවත් විය යුතුය.

( i ).රූපවාහිනී සංදේශ මඟින් ආගම හා සදාචාරය නියෝජන කරන වැඩසටහන් 2ක් නම් කරන්න.

( ii ).පුද්ගල රසඥතාව කෙටියෙන් හඳුන්වන්න.

( iii ).අප රටේ ග්‍රාමීය සමාජයේ අදටත් භාවිතා වන සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම 3ක් කෙටියෙන් විස්තර කරන්න.

( iv ).අලුතින් හඳුන්වා දෙන සබන් වර්ගයක් සඳහා පුවත්පතකට වෙළඳ දැන්වීමක් නිර්මාණය කරන්න.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ අවසාන ඇගයීම - 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

II පත්‍රය - 10 ශ්‍රේණිය

<u>පිළිතුරු පත්‍රය</u>

* 1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 20 යි
* 2 සිට 7 ප්‍රශ්නය දක්වා තෝරාගත් ප්‍රශ්න 4 කට ලකුණු 10 බැගින් හිමිවේ.
* කොටස් ලකුණු
  - I කොටසට ලකුණු = 01
  - II කොටසට ලකුණු = 02
  - III කොටසට ලකුණු = 03
  - IV කොටසට ලකුණු = 04

(01) ( i ) ජන සන්නිවේදනය

( ii ) අභිසාරී මාධ්‍ය / අභිසාරීතාව

( iii ) පුවත් පත -පාඨකයා ,ගුවන්විදුලිය- ශ්‍රාවකයා /අසන්නා

( iv ) ලේක්හවුස් /එක්සත් පුවත්පත් සමාගම

( v ) මාණ්ඩලික මාධ්‍යවේදීන් ,ප්‍රාදේශීය මාධ්‍ය වේදීන්

( vi ) වෙළද දැන්වීම්වල ,ටෙලිනාට්‍ය වල නාමවලියේදී,ප්‍රවෘත්ති වලදී

වැඩසටහන් නාමාවලිවල , අනුග්‍රාහක දැන්වීම් ප්‍රචාරයේදී.

( vii ) කාලය අලෙවි කිරීම (ආදායම් ලැබීම )සෘජු දැන්වීම් ප්‍රචාරය .

අනුග්‍රාහක දැන්වීම් ප්‍රචාර,

( viii ) තනි දාමය ඕපාදූප දාමය ,සම්භාවිතා දාමය ,පර්ෂද දාමය

( ix ) භාෂා ද්වීරූපතාවය

( x ) ගුවන්විදුලිය (2x10=20)

(02) (1) හැරල්ඩ් ලැස්වෙල්

(2) B -සංදේශය C - මාධ්‍ය D - ග්‍රාහකයා E - බලපෑම

(3) අර්ථ බාධක,මාධ්‍ය බාධක,විස්තර කළ යුතු ය.

(4) තොරතුරු සම්පාදනය,අධ්‍යාපනය,පෙළඹවීම,විනෝදාස්වාද සම්පාදනය,සමාජානුයෝජනය,සංවාද හා සාකච්ඡා,සංස්කෘතික ප්‍රගමනය,සමාජ ඒකාබද්ධතාව

(03)(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය/අන්තර් පුද්ගල සන්නිවේදනය/කණ්ඩායම් සන්නිවේදනය /ජන සන්නිවේදන

(2) ප්‍රදීපාගාර උපක්‍රමය

(3) තමා සතු අදහස්,තොරතුරු ප්‍රමාණය පුළුල් කර ගැනීම/ කථන රටා පුහුණු වීම/පෙර සූදානම/සවන් දීමට පුහුණු වීම/අංග චලන,විවිධ ඉරියව් භාවිතයට පුහුණු වීම.

(4) සංඥා,සංකේත,ඉඟි බිඟි,ඇඳුම් පැළඳුම්,පාර භාෂාව,හඬ,උපකරණ.මෙවලම් ආදී ඕනෑම අංග 04ක් පැහැදිලි කළ යුතුය

(04) (1) ජංගම දුරකථනයෙන් ලබා ගන්නා ප්‍රයෝජන 2 කට ලකුණු ලබා දෙන්න.(පණිවුඩ හුවමාරුව හැර)

(2) ෆැක්ස් යන්ත්‍රය,විද්‍යුත් තැපැල,පේජරය

(3) කලු/සුදු/කොළ ලෑල්ල/කාන්දම් ලෑල්ල/පත්‍රිකා ලෑල්ල/පිටු පෙරලනය

(4) එම උපකරණ පිළිබඳ විස්තර කිරීමට

(05) (1) ෆේස් බුක්,වට්ස් ඇප්,වයිබර්,ඉන්ස්ටර්ග්‍රෑම් වැනි

(2) * ක්ෂණික ව තොරතුරු ලබා ගැනීමට හා ලබා දීමට

* එකවර විශාල පිරිසකට තොරතුරු ලබා දිය හැකි වීම.

* සාපේක්ෂව මිල අඩුවීම.

* ශ්‍රව්‍ය,දෘශ්‍ය,ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයෙන් තොරතුරු යැවිය හැකි වීම.

* ලිපිය බලන තෙක් විද්‍යුත් තැපැල් ලිපිනයේ රඳවා ගත හැකි වීම.

* අනවශ්‍ය ලිපි ඉවත් කළ හැකි වීම.

* ලිපි ගබඩා කර ගත හැකි වීම.

(3) කාර්යාලයේ තොරතුරු වහාම ලෝකය පුරා ඕනෑම කෙනෙකුට ග්‍රහණය කර ගත හැකි වීම,තොරතුරු යාවත්කාලීන කිරීමේ පහසුව,තොරතුරු සමාජයට විවෘත කිරීම,තොරතුරු විධිමත්ව ලබා දිය හැකි වීම, තොරතුරු වේගවත්ව නිකුත් කළ හැකි වීම,වෙබ් අඩවිය ඔස්සේ ප්‍රතිචාර ලබා ගත හැකි වීම.

(4) අත් පිටපත සැකසීම,අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීම,මුද්‍රණය හා පිටපත්කරණය නම් කිරීමට,නිමි කටයුතු

(06) (1) ඩිජිටල් කැමරාව

(2) කැමරා කාචය / ද්වාරය / කාච විවරය

(3) විශ්වාසනීයත්වය වැඩි වීම,සත්‍යබව තහවුරු වීම,ආකර්ශනීය බව,කරුණු තහවුරු කර ගත හැකි වීම, විශ්වාසනීයත්වය, සාක්ෂරතාව නොමැති අයට පවා ප්‍රවෘත්තිය වටහා ගත හැකිය.

(4) කර්තෘ හිමි පුවත්පත්
මහජන සංවිධාන හිමි පුවත්පත්
පෞද්ගලික ව්‍යාපාර හිමි පුවත්පත්
දේශපාලන පක්ෂ හිමි පුවත්පත්
රජයට හිමි පුවත්පත්

(07) (1) ආගමික වැඩසටහන්
සාකච්ඡා මණ්ඩප
උපදේශාත්මක වැඩ සටහන්
උපදේශාත්මක ටෙලි නාට්‍ය වැනි

(2) මාධ්‍ය සංදේශ හඳුනාගැනීමට හා විඳ ගැනීමට පුද්ගලයකු සතු හැකියාව රසඥතාවයි.එය පුද්ගල බද්ධය.අධ්‍යාපනය,අත්දැකීම්,සමාජ සාධක ආදිය රසඥතාව කෙරෙහි බලපෑම් ඇති කරයි.

(3) අඩබෙර ගැසීම/සණ්ටාර ගැසීම
සංකේත භාවිතය
දැන්වීම් ප්‍රදර්ශනය
දුම් ගැසීම,බෙර හඬ,හූ හඬ යනාදිය.

(4) සබන් වර්ගයේ නම,නිෂ්පාදන ආයතනය,අඩංගු ද්‍රව්‍ය,මිල,නිෂ්පාදිත දිනය,කල් ඉකුත් වීමේ දිනය යනාදී කරුණු ඇතුළත්ව ඇති නිර්මාණශීලී දැන්වීමකට